පොලිස් මූලස්ථානය, කොළඹ, ශ්‍රී ලංකාව
பொலிஸ் தலைமையகம், கொழும்பு, இலங்கை
POLICE HEAD QUARTERS, COLOMBO, SRI LANKA

තැ. පෙ. අංකය / த. பெ .இல. / P. O. Box No. 517
ෆැක්ස් / தொலைநகல் / Fax No. 011- 2329500
දුරකථනය / தொலைபேசி / Telephone 011-2384024, 011-2395605
Website: www.police.lk
ඊ - මේල් / மின்-அஞ்சல் / E-Mail Policemedia@police.lk

මගේ අංකය / எனது இல. / My No. PMD / PR / 1229 / 21
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date 2021.09.30
පැය 1045

**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

# මාධ්‍ය නිවේදනය

**අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ පෙනී සිටින ලෙස මාධ්‍යවේදීන් කිහිපදෙනෙකුට දැනුම් දීම සම්බන්ධව**

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධරයන් විසින් පසුගිය දිනෙක එම දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යන විමර්ශනයකට අදාළව ප්‍රකාශ ලබා ගැනීම සඳහා විවිධ මාධ්‍ය ආයතන කිහිපයක කතෘවරුන් ඇතුළු මාධ්‍යවේදීන් කිහිපදෙනෙකුට එම දෙපාර්තමේන්තුව වෙත පැමිණීමට දන්වා ඇති බව වාර්තා විය.

මෙම තත්ත්වය අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ සාමාන්‍ය කාර්ය පටිපාටිය නොවන අතර අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් විමර්ශන සඳහා යම් මාධ්‍යයක සහාය ඉල්ලා සිටි අවස්ථා වල දී එම මාධ්‍ය ආයතන විසින් සහාය ලබා දෙන බැවින් පුවත්පත් කතෘවරුන් එම දෙපාර්තමේන්තුව වෙත කැඳවීම සාමාන්‍යයෙන් සිදු නොකෙරේ.

වාර්තා වී ඇති එම සිදුවීමේ දී අපහසුතාවයට පත් වූ පුවත්පත් කතෘවරුන් ඇතුළු මාධ්‍යවේදීන් වෙත කණගාටුව පළ කරන අතර අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ වෘත්තීමයභාවයට කැළලක් වන අන්දමින් වගකීම් විරහිතව නොසැළකිලිමත් ලෙස කටයුතු කර ඇති එම දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සම්බන්ධයෙන් පොලිස්පති නියමයෙන් මේ වන විට විමර්ශනයක් ආරම්භ කර ඇත.

මාධ්‍යවේදීන් ද ඇතුළුව මහජනතාවගේ අදහස් ප්‍රකාශ කිරීමේ අයිතියට ශ්‍රී ලංකා පොලිසිය සෑම විටම ගරු කරන බව අවධාරණය කරනු ලැබේ.

**පොලිස් මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය,**
**පොලිස් මූලස්ථානය.**